# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்ந்நி அபிவிருந்நி நிணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය

සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு

சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது<br>My No | DSD/HO/6/EP/2/9/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | .......................................... | දිනය<br>திகதி<br>Date | 2021.03.19 |
|---|---|---|---|---|---|

සියළුම, දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් ,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,

සහකාර අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

සමෘද්ධි කළමණාකරුවන් හා

සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>“සමෘද්ධි අභිමානී - 2021” අලෙවි පොල</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන අංශය මගින් “සමෘද්ධි අභිමානී” වෙළඳ ප්‍රදර්ශනය මෙම වසරේ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද මුල් කරගෙන පැවැත්වීමට අදහස් කර ඇත. එහිදී ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදනවලට ඇති ඉල්ලුම හා අලෙවි අවස්ථා පුළුල් කරලීමත් එම නිෂ්පාදන දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රචලිත කිරීමත් විශේෂයෙන්ම උත්සව සමයේදී අත්‍යාවශ්‍ය භාණ්ඩ සහන මිලට ජනතාව වෙත මිලදී ගැනිමට අවස්ථාව සලසා දීමත් අරමුණු කොට පැවැත්වීමට අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

02. දිස්ත්‍රික්කයේ <u>සෑම සමෘද්ධි බැංකු කලාපයක් තුලම</u> අලෙවි පොලක් සංවිධානය කළ යුතු අතර සමෘද්ධි ව්‍යාපාරික සංගම් සහ ප්‍රජාමූල සංවිධානවල යෝජනා ද ලබාගැනිමට හැකිවන පරිදි මෙහෙයුම් කමිටුවක් පිහිටුවා එමගින් පොල කටයුතු පැවැත්වීමට සැලසුම් කිරීම වඩා යෝග්‍ය වන අතර පහත කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2** |

i. අලෙවි පොල සඳහා අත්‍යාවශ්‍යයෙන්ම දැරිය යුතු වෙලඳ කුටි, විදුලිය, ප්‍රචාරනය ආදි වියදම් සඳහා එක් සමෘද්ධි කලාපයක් සඳහා වෙන් කර ඇති උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 50,000.00 ක් වන අතර අලෙවි පොල දින 2ක් වත් පැවැත්වීම ප්‍රතිඵලදායී වනු ඇත.

ii. "ආදරණීය වෙළෙන්දා" යන තේමාව මුල් කරගනිමින් මෙවර අලෙවි පොල සංවිධානය කල යුතු අතර වෙළඳ කුටි සැපයීමේදී ව්‍යාපාරික ප්‍රජාවගෙන් මුදල් අය නොකල යුතුය. එසේම, එහි වාසිය පාරිභෝගිකයා වෙත ලබා දිය යුතු බවත් ඔවුන්ට වැඩි සහනයක් ලැබෙන ලෙස තම නිෂ්පාදන වල තත්ත්වය, ගුණත්වය මෙන්ම විශේෂයෙන් මිල පිළිබඳව මෙවර වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බවත් ව්‍යාපාරික ප්‍රජාව දැණුවත් කළ යුතුය.

iii. සහල්, පොල් වැනි අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ***සහන මිලට*** ප්‍රජාව වෙත සපයන වෙළඳුන්ට ප්‍රමුඛත්වය හා අවස්ථාව සැලසිය යුතුය.

iv. වැඩි ව්‍යාපාරිකයින් පිරිසකට සහභාගී වීමට හැකිවන ලෙස වැඩසටහන සංවිධානය කළ යුතු අතර දිස්ත්‍රික්කය තුල මේ වන විටත් ආරම්භ කර ඇති ආදර්ශ ගම්මානයේ/ගම්මානවල නිෂ්පාදන සඳහා ද ඉඩප්‍රස්ථා ලබාදීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

v. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග දැනටමත් සාකච්ඡා කර ඇති පරිදි සමෘද්ධි අභිමානී අලෙවි පොල සඳහා එම දෙපාර්තමේන්තුවේ වෙළඳ කුටියක් ඉදිරිපත් කිරිමට අපේක්ෂාවෙන් සිටින අතර ඒ පිළිබඳ ඉදිරි කටයුතු සඳහා ඔබ ප්‍රදේශයේ විවිධ සේවා සමුපකාර සමිතිය සමග සම්බන්ධ වීමට කටයුතු කල යුතුය.

vi. එසේම, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, ධීවර සංස්ථාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සහාය ලබාගැනිම පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය.

vii. 2021 සිංහල හා හින්දු අළුත් අවුරුද්ද මුල් කරගෙන අප්‍රේල් මස 6 සිට 12 කාලය තුලදී දිවයින පුරා සියළු අලෙවි පොල පවත්වා අවසන් කළ යුතු අතර සිංහල හා හින්දු ප්‍රජාව ජීවත් නොවන ප්‍රදේශවල අලෙවි පොල සාර්ථක ලෙස පැවැත්වීම පිළිබඳව ගැටළු කාරී

තත්ත්වයක් වේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් මූලිකත්වයෙන් ඒ පිළිබඳව තිරණය කර දැණුම් දිය යුතුය.

viii. ව්‍යාපාරික ප්‍රජාව කාරක ප්‍රාග්ධනය අවශ්‍යතා සඳහා අරමුදල් ඉල්ලා සිටින අවස්ථාවලදී සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ හදිසි ව්‍යාපාරික ණය වැඩසටහන හෝ ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල මගින් ණය සැපයිම කල හැක. එසේම ප්‍රජාමූල සංවිධානය මගින් ලබාදෙන අරුණළු ණය වැඩසටහන මගින් හෝ එම අවශ්‍යතා සැපයීම කළ හැක.

ix. මෙම පොල සංවිධාන කටයුතු ඉටුකිරිමේදි සමෘද්ධි බැංකු සමිතියේ ද සහාය ලබා දිය යුතුය. අවශ්‍ය අවස්ථා වලදි "අලෙවි පොල සංවර්ධන චක්‍රිය අරමුදල" භාවිතා කල හැකි අතර එය නැවත අයකරගත හැකිවන පරිදි කටයුතු කල යුතුය.

x. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහභාගිත්වය හා සහාය හැකි සෑම අවස්ථාවකම ලබාදීමට අදහස් කරන බැවින් ප්‍රදර්ශන පැවැත්වෙන දින හා අවශ්‍ය සහාය පිළිබඳව ව්‍යවසාය සංවර්ධන අංශය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

xi. වෙන් කර ඇති ප්‍රතිපාදන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල උපදෙස් හා මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වැය කළ යුතු අතර ප්‍රදර්ශනය අවසානයේ මේ සමග අමුණා ඇති තොරතුරු ආකෘතිය පුරවා කඩිනමින් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත යොමු කල යුතුය.

මෙම වැඩසටහන සාර්ථක කරගැනිමට ඔබ දක්වන සහයෝගය අගය කරමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා,
හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි
2. සමුපකාර කොමසාරිස්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගනක - කා.දැ.ගැ.පි